# සතිපතා ආර්ථික දර්ශක

2019 ජූනි 21



සංඛ්‍යාන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

# සතියේ සුවිශේෂී කරුණු

## මූර්ත අංශය

ජා.පා.මි. දර්ශකයෙහි ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය 2019 අප්‍රේල් මාසයේ සියයට 3.6 හි සිට 2019 මැයි මාසයේ දී සියයට 3.5 දක්වා පහළ ගියේය. 2019 මැයි මාසයේ දී ජා.පා.මි. දර්ශකයෙහි මාසික වෙනස්වීම සියයට 1.1 කින් ඉහළ ගියේය.

2019 වර්ෂයේ පළමු කාර්තුවේදී මූර්ත ද.දේ.නි. සියයට 3.7 කින් වර්ධනය විය. මේ සඳහා, සේවා කටයුතු සියයට 4.1 කින්, කර්මාන්ත කටයුතු සියයට 3.0 කින් සහ කෘෂිකාර්මික කටයුතු සියයට 5.5 කින් වර්ධනය වීම හේතු විය.

සලකා බලන කාලපරිච්ඡේදය තුළදී බොරතෙල් මිල ගණන් ඉහළ යෑමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කළේය. මැදපෙරදිග කලාපයේ ඇති වූ අර්බුදකාරී තත්ත්වය සහ ගෝලීය වර්ධනය ඉහල යාමට හේතුවන එ.ජ. පොළී අනුපාත පහල යනු ඇතැයි පවතින අපේක්ෂා ගෝලීය බොරතෙල් මිල ගණන් ඉහළ යෑමට ප්‍රධාන වශයෙන් බලපාන ලදී. සමස්තයක් ලෙස මෙම කාලපරිච්ඡේදය තුළ දී බ්‍රෙන්ට් සහ ඩබ්ලිව්.ටී.අයි. බොරතෙල් බැරලයක මිල පිළිවෙලින් එ.ජ. ඩොලර් 2.5 කින් සහ එ.ජ. ඩොලර් 5.0 කින් ඉහළ ගියේය.

## මුදල් අංශය

සතිපතා බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය පෙර සතිය හා සැසඳීමේ දී 2019 ජූනි මස 21 වන දින වනවිට පදනම් අංක 21 කින් 11.53% ක් දක්වා ඉහළ ගියේය.

ප්‍රධාන වශයෙන් වාණිජ බැංකු සතු තැන්පතු ප්‍රමාණය ඉහළ යාම හේතුකොටගෙන පසුගිය සතියට සාපේක්ෂව සංචිත මුදල් ඉහළ යන ලදී.

සමස්ත වෙළෙඳපොළ ද්‍රවශීලතාව පෙර සතියේ අග පැවති රුපියල් බිලියන 56.08 අතිරික්තයට සාපේක්ෂව මෙම සතියේදී රුපියල් බිලියන 43.64 අතිරික්තයක් විය.

පෙර සතිය හා සැසඳීමේදී 2019 ජූනි මස 21 වන දින වනවිට, සමස්ත කොටස් මිල දර්ශකය 0.38% කින් 5,363.5 ක් දක්වා සහ එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 දර්ශකය 0.94% කින් 2,489.0 ක් දක්වා පහළ ගියේය.

## රාජ්‍ය අංශය

2019 වසරේ පළමු මාසය තුළදී, ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස රාජ්‍ය ආදායම 2018 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ වාර්තා වූ සියයට 1.0 ක මට්ටමේ නොවෙනස්ව පැවතුණි.

සලකා බලන කාලපරිච්ඡේදය තුළදී, ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය දීම් අඩු වීම පිළිබිඹු කෙරෙමින් ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සමස්ත වියදම සහ ශුද්ධ ණය දීම් 2018 අනුරූප කාලපරිච්ඡේදයේ පැවති සියයට 1.9 ට සාපේක්ෂව සියයට 1.6 දක්වා අඩු විය.

ප්‍රධාන වශයෙන් ප්‍රාග්ධන වියදම් අඩුවීම හේතුවෙන් ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සමස්ත අයවැය හිඟය පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ පැවති සියයට 0.8 සිට සියයට 0.7 දක්වා සුළු වශයෙන් අඩු විය.

අයවැය හිඟය මූල්‍යනයේදී ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස දේශීය මූල්‍යයනය 2018 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ පැවති සියයට 0.8 ට සාපේක්ෂව සියයට 1.9 දක්වා වැඩි වූ අතර ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස විදේශීය මූල්‍යනය 2018 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ පැවති සියයට 0.01 ක ශුද්ධ ණය ආපසු ගෙවීමට සාපේක්ෂව සියයට 1.3 ක ශුද්ධ ණය ආපසු ගෙවීමක් වාර්තා කළේය.

නාමික වශයෙන්, මධ්‍යම රජයේ සමස්ත නොපියවූ ණය ප්‍රමාණය 2018 වසර අවසානයේදී පැවති රුපියල් බිලියන 11,977.5 සිට 2019 ජනවාරි මස අවසානය වන විට රුපියල් බිලියන 11,939.7 දක්වා අඩු විය. මෙයින්, සමස්ත දේශීය ණය ප්‍රමාණය රුපියල් බිලියන 6,202.9 දක්වා සියයට 3.1 කින් වැඩි වූ අතර වාණිජ ණය ආපසු ගෙවීම හේතුවෙන් සමස්ත නොපියවූ විදේශීය ණය ප්‍රමාණයේ රුපියල් අගය 2019 ජනවාරි අවසානය වන විට රුපියල් බිලියන 5,736.8 දක්වා සියයට 3.7 කින් අඩු විය.

## විදේශීය අංශය

2019 වසරේ ජූනි මස 21 වන දින දක්වා කාලය තුළදී ශ්‍රී ලංකා රුපියල, එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 3.4 කින් අතිප්‍රමාණය වූ අතර අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින් රුපියල ස්ටර්ලිං පවුමට සාපේක්ෂව සියයට 3.2 කින්, ජපන් යෙන්වලට සාපේක්ෂව සියයට 0.4 කින්, යුරෝවලට සාපේක්ෂව සියයට 4.7 කින් සහ ඉන්දියානු රුපියලට සාපේක්ෂව සියයට 5.7 කින් අතිප්‍රමාණය විය.

2019 වසරේ පළමු මාස හතර තුළදී අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 3,954 ක් දක්වා සියයට 4.5 කින් වර්ධනය වූ අතර, මේ සඳහා රෙදිපිළි හා ඇඟලුම් (9.9%), රබර් නිෂ්පාදිත (1.9%), ආහාර, පාන වර්ග හා දුම්කොළ (6.5%), ,පොල් (10.7%), මුහුදු ආහාර (11.1%), මූලලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (25.2%) සහ මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත (273.6%) අපනයන ආදායම ඉහළ යෑම හේතු විය. 2019 වසරේ පළමු මාස හතර තුළදී ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 6,412 ක් දක්වා සියයට 17.4 කින් පහත වැටුණු අතර, රත්‍රන් (-99.8%), පෞද්ගලික භාවිතය සඳහා ගනු ලබන රථවාහන (-57.9%), ඉන්ධන (-6.3%), සහල් (-95.0%) සහ ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (-19.8%) ආනයනය පහත වැටීම මේ සඳහා විශාල වශයෙන් හේතු විය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2019 වසරේ පළමු මාස හතර තුළදී වෙළඳ හිඟය 2018 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේදී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 3,981 සිට එ.ජ. ඩොලර් මිලියන 2,458 ක් දක්වා අඩු විය.

ප්‍රධාන වශයෙන්ම කාර්මික හා කෘෂිකාර්මික අපනයනවල මිල ගණන් පහත වැටීම හේතුවෙන් 2019 අප්‍රේල් මාසයේදී අපනයන මිල දර්ශකය පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 8.3 කින් පහත වැටුණි. ආනයන යටතේ වර්ග කර ඇති සියලුම ප්‍රධාන කාණ්ඩවල මිල ගණන් පහත වැටීම හේතුවෙන් 2019 අප්‍රේල් මාසයේදී ආනයන මිල දර්ශකය පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 3.0 කින් පහත වැටුණි. මේ අනුව, 2019 අප්‍රේල් මාසයේදී වෙළඳ මිල අනුපාතය පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව දර්ශකාංක 108.3 ක් දක්වා සියයට 5.4 කින් පිරිහීමට ලක්විය.

තේ සඳහා සාමාන්‍ය මිල (කොළඹ වෙන්දේසි මිල) 2018 අප්‍රේල් මාසයේ පැවති කිලෝග්‍රෑමයට එ.ජ. ඩොලර් 3.89 සිට 2019 අප්‍රේල් මාසයේදී කිලෝග්‍රෑමයට එ.ජ. ඩොලර් 3.31 ක් දක්වා පහත වැටුණි.

2019 වසරේ අප්‍රේල් මාසයේ දී , සහල්, තිරිඟු සහ බොරතෙල් ආනයන මිල ගණන් 2018 වසරේ අනුරූප මාසයට සාපේක්ෂව ඉහළ ගිය අතර, සීනි ආනයන මිල ගණන් පහත වැටුණි.

# මූර්ත අංශය

## 1.1 මිල දර්ශක

| ජාතික පාරිභෝගික මිල දර්ශකය (2013=100) | මැයි 2019 | මාසයකට පෙර | අවුරුද්දකට පෙර |
|---|---|---|---|
| ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද.) | 128.7 | 127.3 | 124.3 |
| මාසික ප්‍රතිශත වෙනස % | 1.1 | 0.7 | 1.1 |
| වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස % | 2.0 | 1.9 | 5.7 |
| ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස % | 3.5 | 3.6 | 2.1 |
| | | | |
| මූලික උද්ධමනය - (ජා.පා.මි.ද.) | 133.0 | 132.6 | 125.1 |
| වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස % | 4.0 | 3.7 | 3.1 |
| ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස % | 6.3 | 6.3 | 1.7 |

ජා.පා.මි.ද. ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස




| කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2013=100) | මැයි 2019 | මාසයකට පෙර | අවුරුද්දකට පෙර |
|---|---|---|---|
| කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද.) | 129.0 | 127.0 | 122.9 |
| මාසික ප්‍රතිශත වෙනස % | 1.6 | 0.3 | 1.2 |
| වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස % | 4.2 | 4.1 | 5.7 |
| ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස % | 5.0 | 4.5 | 4.0 |
| | | | |
| මූලික උද්ධමනය- (කො.පා.මි.ද.) | 134.2 | 133.1 | 126.4 |
| වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස % | 4.4 | 4.2 | 4.5 |
| ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස % | 6.2 | 5.5 | 3.2 |

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

කො.පා.මි.ද. ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස




## 1.2 මිල

### 1.2.1 පිටකොටුව වෙළෙඳපොළ

| ආහාර අයිතමය | තොග මිල ගණන්හි සාමාන්‍යය | | | | සිල්ලර මිල ගණන්හි සාමාන්‍යය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | මෙම සතිය | පසුගිය සතිය | පසුගිය මාසය | පසුගිය වසර | මෙම සතිය | පසුගිය සතිය | පසුගිය මාසය | පසුගිය වසර |
| | කිලෝ ග්‍රෑමයට රුපියල් | | | | කිලෝ ග්‍රෑමයට රුපියල් | | | |
| **සහල්** | | | | | | | | |
| සම්බා | 81.00 | 83.40 | 82.00 | 103.20 | 85.00 | 87.60 | 90.00 | 109.80 |
| රතු කැකුළු | 68.00 | 69.60 | 68.00 | 70.20 | 75.00 | 79.00 | 75.00 | 77.80 |
| **එළවළු** | | | | | | | | |
| බෝංචි | 124.00 | 148.00 | 175.00 | 248.50 | 160.00 | 182.00 | 220.00 | 300.23 |
| ගෝවා | 50.00 | 56.00 | 65.00 | 128.23 | 90.00 | 90.00 | 102.50 | 168.33 |
| කැරට් | 134.00 | 124.00 | 145.00 | 311.40 | 174.00 | 160.00 | 185.00 | 354.67 |
| තක්කාලි | 50.00 | 44.00 | 86.25 | 215.50 | 80.00 | 71.00 | 125.00 | 259.83 |
| වට්ටක්කා | 106.00 | 92.00 | 80.00 | 29.20 | 140.00 | 128.00 | 100.00 | 56.27 |
| පතෝල | 70.00 | 72.00 | 130.00 | 109.33 | 100.00 | 120.00 | 170.00 | 147.67 |
| වම්බටු | 66.00 | 62.00 | 130.00 | 125.93 | 97.00 | 95.00 | 165.00 | 171.00 |
| **අනෙකුත් ආහාර** | | | | | | | | |
| රතු ළූණු (දේශීය) | 150.00 | 150.00 | 160.00 | 119.60 | 180.00 | 180.00 | 200.00 | 161.00 |
| ලොකු ළූණු (දේශීය) | ලැනො. | ලැනො. | ලැනො. | ලැනො. | ලැනො. | ලැනො. | ලැනො. | ලැනො. |
| අර්තාපල් (නුවර එළිය) | 162.50 | 160.40 | 160.00 | 141.60 | 193.00 | 190.40 | 180.00 | 167.00 |
| වියළි මිරිස් (ආනයනික) | 270.00 | 270.00 | 270.00 | 253.00 | 326.00 | 330.00 | 320.00 | 299.00 |
| පරිප්පු (ඉන්දියානු) | 110.00 | 110.00 | 108.00 | 108.40 | 120.00 | 120.00 | 120.00 | 120.00 |
| බිත්තර (සුදු) | 16.75 | 14.70 | 14.50 | 14.44 | 17.75 | 15.70 | 15.50 | 15.58 |
| පොල් (ගෙඩියක මිල) | 31.88 | 30.00 | 39.25 | 65.20 | 37.38 | 36.50 | 47.88 | 77.20 |
| අමු මිරිස් | 422.00 | 394.00 | 250.00 | 400.00 | 478.00 | 442.00 | 311.25 | 467.14 |
| දෙහි | 384.00 | 315.00 | 310.00 | 65.00 | 435.00 | 385.00 | 500.00 | 96.00 |
| **මාළු (අ)** | | | | | | | | |
| කෙලවල්ලා | 580.00 | 650.00 | 550.00 | 662.50 | 880.00 | 1,000.00 | 850.00 | 935.00 |
| බලයා | 400.00 | 530.00 | 300.00 | 356.00 | 500.00 | 630.00 | 400.00 | 456.00 |
| සාලයා | 246.00 | 280.00 | 185.00 | 182.00 | 300.00 | 322.00 | 225.00 | 240.00 |
| පරව් | 705.00 | 720.00 | 625.00 | 676.00 | 1,012.50 | 1,060.00 | 925.00 | 1,010.00 |

(අ) පෑලියගොඩ ධීවර වෙළඳපොළෙන් එක්රැස් කරනු ලබන මිල ගණන් මත පදනම් වේ



















## 1.2.2 දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය

| අයිතමය (කිලෝ ග්‍රෑමයට රුපියල්) | සාමාන්‍යය මිල ගණන් - මෙම සතිය | |
|---|---|---|
| | තොග මිල | සිල්ලර මිල |
| **සහල්** | | |
| සම්බා | 87.20 | 91.80 |
| රතු කැකුළු | 67.40 | 73.00 |
| **එළවළු** | | |
| බෝංචි | 101.88 | 122.50 |
| කැරට් | 132.50 | 152.50 |
| තක්කාලි | 29.70 | 49.50 |
| වට්ටක්කා | 99.38 | 119.38 |
| පතෝල | 50.50 | 70.50 |
| අළු කෙසෙල් | 64.00 | 83.75 |
| **අනෙකුත් ආහාර** | | |
| රතු ළූණු (දේශීය) | 141.00 | 151.00 |
| ලොකු ළූණු (දේශීය) | ලැනො | ලැනො |
| අර්තාපල් (නුවර එළිය) | 156.50 | 166.50 |
| වියළි මිරිස් (ආනයනික) | 284.00 | 294.10 |
| පොල් (ගෙඩියක මිල) | 30.20 | 35.20 |

## 1.2.4 මරදගහමුල සහල් මධ්‍යස්ථානය

| අයිතමය (කිලෝ ග්‍රෑමයට රුපියල්) | සහල් තොග මිල ගණන්හි සාමාන්‍යය | | | |
|---|---|---|---|---|
| | මෙම සතිය | පසුගිය සතිය | පසුගිය මාසය | පසුගිය වසර |
| සම්බා | 79.70 | 80.80 | 83.00 | 101.40 |
| සුදු කැකුළු | 75.50 | 76.10 | 76.00 | 78.40 |
| රතු කැකුළු | 69.10 | 69.10 | 67.00 | 75.00 |
| නාඩු | 80.80 | 82.40 | 81.38 | 81.80 |

ලැනො - ලැබී නොමැත

## 1.2.3 නාරාහේන්පිට ආර්ථික මධ්‍යස්ථානය

| අයිතමය (කිලෝ ග්‍රෑමයට රුපියල්) | සිල්ලර මිල ගණන්හි සාමාන්‍යය | |
|---|---|---|
| | මෙම සතිය | පසුගිය සතිය |
| **සහල්** | | |
| සම්බා | 95.00 | 95.00 |
| රතු කැකුළු | 74.75 | 74.80 |
| **එළවළු** | | |
| බෝංචි | 145.00 | 182.00 |
| ගෝවා | 137.50 | 132.00 |
| කැරට් | 150.00 | 188.00 |
| තක්කාලි | 80.00 | 92.00 |
| වට්ටක්කා | 140.00 | 104.00 |
| පතෝල | 155.00 | 176.00 |
| වම්බටු | 120.00 | 126.00 |
| අළු කෙසෙල් | 135.00 | 132.00 |
| **අනෙකුත් ආහාර** | | |
| රතු ළූණු (ආනයනික) | 185.00 | 184.00 |
| ලොකු ළූණු (ආනයනික) | 99.75 | 110.00 |
| අර්තාපල් (ආනයනික) | 110.00 | 118.00 |
| වියළි මිරිස් (ආනයනික) | 322.50 | 320.00 |
| පරිප්පු (ඉන්දියානු) | 130.00 | 170.00 |
| බිත්තර (සුදු) (එකක මිල) | 15.50 | 15.50 |
| පොල් (ගෙඩියක මිල) | 50.00 | 50.00 |
| **මාළු** | | |
| කෙලවල්ලා | 1,175.00 | 1,180.00 |
| බලයා | 542.50 | 558.00 |
| සාලයා | 340.00 | 340.00 |
| පරව් (පොඩි) | 777.50 | 795.00 |

## 1.3 කර්මාන්ත මූලය අනුව දළ දේශීය නිෂ්පාදිතය (2010 ස්ථාවර මිල අනුව ) - එකතු කළ අගය මත වර්ධන අනුපාතිකය

| අයිතමය | වාර්ෂික | | පළමු වන කාර්තුව | |
|---|---|---|---|---|
| | 2017 (අ)(ආ) | 2018 (අ) | 2018 (අ)(ආ) | 2019 (අ) |
| කෘෂිකාර්මික | -0.4 | 4.8 | 5.1 | 5.5 |
| කාර්මික | 4.1 | 0.9 | 1.7 | 3.0 |
| සේවා | 3.6 | 4.7 | 5.5 | 4.1 |
| භාණ්ඩ හා සේවා මත අයකෙරෙන බදු -සහනාධාර | 3.3 | -0.4 | 1.1 | 1.7 |
| **දළ දේශීය නිෂ්පාදිතය** | **3.4** | **3.2** | **4.0** | **3.7** |

(අ) තාවකාලික (ආ) සංශෝධිත




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 1.4 කෘෂිකාර්මික නිෂ්පාදනය

| අයිතමය | ඒකකය | 2019 ජන. -අප්‍රේල් (අ) | 2018 ජන. -අප්‍රේල් (ආ) | % වෙනස |
|---|---|---|---|---|
| වී | (කි.ග්‍රෑ. මිලියන) | 96.58 | 101.74 | -5.07 |
| රබර් | (කි.ග්‍රෑ. මිලියන) | 28.63 | 27.06 | 5.83 |
| පොල් | (ගෙඩි මිලියන) | 1,036.70 | 781.37 | 32.68 |

(අ) තාවකාලික (ආ) සංශෝධිත




## 1.5 කාර්මික නිෂ්පාදන දර්ශකය (කා.නි.ද) (2015=100) (අ)

| අයිතමය | අප්‍රේල් | | % වෙනස |
|---|---|---|---|
| | 2018 (ආ) | 2019 (ආ) | |
| **කාර්මික නිෂ්පාදන දර්ශකය** | **97.7** | **96.9** | **-0.8** |
| ආහාර නිෂ්පාදන | 103.7 | 93.4 | -9.9 |
| ඇඟලුම් නිෂ්පාදන | 102.0 | 110.2 | 8.1 |
| අනෙකුත් ලෝහ නොවන ඛණිජ නිෂ්පාදන | 90.4 | 83.1 | -8.1 |
| පිරිපහදුකළ ඛණිජතෙල් නිෂ්පාදන | 96.0 | 112.1 | 16.8 |
| රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන | 82.2 | 100.9 | 22.8 |
| රසායනික ද්‍රව්‍ය සහ රසායනික ද්‍රව්‍ය ආශ්‍රිත නිෂ්පාදන | 78.5 | 90.2 | 15.0 |
| පාන වර්ග | 94.9 | 111.3 | 17.3 |

(අ) ප්‍රධාන උප අංශ 7

(ආ) සංශෝධිත (ආ)තාවකාලික




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 1.6 ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

| මාසය/වසර | ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - නිෂ්පාදන | | | | ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - සේවා | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | මැයි 2019 | අප්‍රේල් 2019 | මැයි 2018 | අප්‍රේල් 2018 | මැයි 2019 | අප්‍රේල් 2019 | මැයි 2018 | අප්‍රේල් 2018 |
| දර්ශකය | 50.7 | 41.0 | 60.6 | 45.5 | 44.7 | 45.3 | 56.9 | 53.2 |







## 1.7 වැටුප් සහ සේවා නියුක්තිය

### 1.7.1 වැටුප් ප්‍රමාණ දර්ශක

| අයිතමය | 2019 අප්‍රේල් | 2018 අප්‍රේල් | % වෙනස |
|---|---|---|---|
| රාජ්‍ය අංශයේ සේවකයන් (2012 = 100) | 162.2 | 161.0 | 0.7 |
| අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන් (2012 = 100) | 176.9 | 168.9 | 4.8 |
| කෘෂිකර්මාන්ත | 185.1 | 170.9 | 8.3 |
| කර්මාන්ත | 179.7 | 171.4 | 4.8 |
| සේවා | 170.8 | 165.5 | 3.2 |



## 1.7.2 සේවා නියුක්තිය (අ)

| අයිතමය | 2017 සිව්වන කාර්තුව | 2018 සිව්වන කාර්තුව (ආ) | 2018 වාර්ෂික(ආ) |
|---|---|---|---|
| ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය | 54.1 | 52.2 | 51.8 |
| සේවා වියුක්ති අනුපාතිකය | 4.0 | 4.6 | 4.4 |
| **අංශය අනුව සේවා නියුක්ත පුද්ගලයන් (ඇ) (මුළු සේවා නියුක්තියෙන් ප්‍රතිශතයක් ලෙස)** | | | |
| කෘෂිකර්මාන්ත | 27.0 | 25.6 | 25.5 |
| කර්මාන්ත | 28.3 | 27.7 | 27.9 |
| සේවා | 44.7 | 46.7 | 46.6 |

(අ) වැඩ කරන වයසේ ජනගහනය අවුරුදු 15 සහ ඊට වැඩි වේ

(ආ) තාවකාලික  (ඇ) ජාත්‍යන්තර ප්‍රමිති වර්ගීකරණ 4 වන සංශෝධනය මත පදනම් වේ

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව







## 1.8 බොර තෙල් සාමාන්‍ය මිල

| මාසය | 2018 | | | 2019 | | |
|---|---|---|---|---|---|---|
| | ඉදිරි වෙළඳපොළ මිල (බැරලයක් එ.ජ. ඩොලර්) | | ලං.ඛ.නී.සං. ආනයන මිල (මි.ර.ගැ) (බැරලයක් එ.ජ. ඩොලර්)(*) | ඉදිරි වෙළඳපොළ මිල (බැරලයක් එ.ජ. ඩොලර්) | | ලං.ඛ.නී.සං. ආනයන මිල (මි.ර.ගැ) (බැරලයක් එ.ජ. ඩොලර්)(*) |
| | බ්‍රෙන්ට් (පාදක මිල) | ඩබ්ලිව්.ටී.අයි. (පාදක මිල) | | බ්‍රෙන්ට් (පාදක මිල) | ඩබ්ලිව්.ටී.අයි. (පාදක මිල) | |
| ජනවාරි | 69.02 | 63.55 | 72.04 | 59.63 | 51.13 | 62.80 |
| පෙබරවාරි | 65.80 | 62.26 | - | 64.23 | 54.84 | 68.65 |
| මාර්තු | 66.69 | 62.80 | 67.97 | 66.97 | 58.08 | 70.97 |
| අප්‍රේල් | 71.55 | 66.21 | 74.31 | 71.45 | 63.76 | 75.59 |
| මැයි | 76.88 | 69.92 | 80.68 | 70.49 | 61.09 | |
| ජූනි | 75.70 | 66.93 | 79.80 | | | |
| ජූලි | 75.17 | 70.87 | 78.76 | | | |
| අගෝස්තු | 73.80 | 67.85 | 77.82 | | | |
| සැප්තැම්බර් | 79.02 | 70.02 | 83.26 | | | |
| ඔක්තෝබර් | 80.93 | 71.10 | 84.95 | | | |
| නොවැම්බර් | 66.66 | 57.19 | 77.97 | | | |
| දෙසැම්බර් | 58.16 | 49.47 | 62.18 | | | |
| | 2018 | | | 2019 | | |
| ජූනි 15 | 73.44 | 65.06 | | - | - | |
| ජූනි 16 | - | - | | - | - | |
| ජූනි 17 | - | - | | 62.25 | 52.28 | |
| ජූනි 18 | 72.54 | 63.37 | | 60.82 | 51.82 | |
| ජූනි 19 | 74.97 | 65.60 | | 62.27 | 54.08 | |
| ජූනි 20 | 75.28 | 65.30 | | 62.52 | 54.47 | |
| ජූනි 21 | 74.51 | 65.61 | | 64.77 | 57.28 | |

මූලයන්: බ්ලූම්බර්ග් තොරතුරු සේවය
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

(*) ලං.ඛ.නී.සං. ආනයන මිල ගණන්වලට ගැල් කුලී ඇතුළත් වීම සහ එය විවිධ බොරතෙල් වර්ගවල සාමාන්‍ය මිල ගණන් අනුව බර තබන ලද මිලක් වන බැවින් ලං.ඛ.නී.සං. ආනයන මිල, බ්‍රෙන්ට් සහ ඩබ්ලිව්.ටී.අයි. ඉදිරි වෙළඳපොළ මිල ගණන් සමඟ ඍජුව සැසඳිය නොහැකිය. එසේම, ලං.ඛ.නී.සං. ආනයනවලින් කොටසක් කාලීන ගිවිසුම් මත පදනම් වේ.

# මුදල් අංශය

## 2.1 පොලී අනුපාතික

| අයිතමය | 2019 ජූනි 21 දිනෙන් අවසන් සතිය | සතියකට පෙර | වසරකට පෙර |
|---|---|---|---|
| **ප්‍රතිපත්ති පොලී අනුපාතික** | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය | 7.50 | 7.50 | 7.25 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය | 8.50 | 8.50 | 8.50 |
| බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල්අනුපාතිකය (AWCMR) (සතිපතා සාමාන්‍යය) | 7.96 | 7.91 | 8.44 |
| **ශ්‍රී ලංකා අන්තර් බැංකු අර්පණ අනුපාතිකය (SLIBOR)** | | | |
| දින 1 | 7.99 | 7.93 | 8.49 |
| දින 7 | 8.51 | 8.54 | 8.51 |
| මාස 1 | 8.71 | 8.71 | 9.01 |
| මාස 3 | 9.68 | 9.76 | 10.05 |
| මාස 6 | 10.79 | 10.80 | 10.74 |
| මාස 12 | 11.51 | 11.51 | 11.44 |
| **භාණ්ඩාගාර බිල්පත් ඵලදා අනුපාතික** | | | |
| දින 91 | 8.38 | 8.38 | 8.34 |
| දින 182 | 8.60 | 8.63 | 8.87 |
| දින 364 | 8.86 | _ | 9.44 |
| **බලපත්‍රලාභී වාණිජ බැංකු** | | | |
| බරිත සාමාන්‍යය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකය (AWPR) | 11.53 | 11.32 | 11.33 |
| | 2019 අප්‍රේල් | මසකට පෙර | වසරකට පෙර |
| ඉතිරිකිරීමේ තැන්පතු | 0.20-7.50 | 0.20-8.50 | 0.50-8.50 |
| එක් අවුරුදු ස්ථාවර තැන්පතු | 4.00-15.00 | 4.00-15.00 | 4.53-15.00 |
| | 2019 මැයි | මසකට පෙර | වසරකට පෙර |
| බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය (AWDR) | 9.00 | 8.97 | 8.91 |
| බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWFDR) | 11.19 | 11.15 | 11.23 |
| | 2019 අප්‍රේල් | මසකට පෙර | වසරකට පෙර |
| බරිත සාමාන්‍ය ණය පොලී අනුපාතිකය (AWLR) | 14.47 | 14.49 | 14.13 |
| **ජාතික ඉතිරිකිරීමේ බැංකුව** | | | |
| | 2019 අප්‍රේල් | මසකට පෙර | වසරකට පෙර |
| ඉතිරිකිරීමේ තැන්පතු | 4.00 | 4.00 | 4.00 |
| එක් අවුරුදු ස්ථාවර තැන්පතු | 10.50 | 10.50 | 10.50 |

| භාණ්ඩාර බැඳුම්කර වෙන්දේසිය | වසර 02, මාස 04 | වසර 08, මාස 09 |
|---|---|---|
| | 13/6/2019 | 13/6/2019 |
| පොලී අනුපාතිකය | 9.45 | 10.75 |
| බර තබන ලද සාමාන්‍ය ඵලදා අනුපාතිකය | 9.79 | 10.63 |

| බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය බැංකු අනුව | 2019 ජූනි 21 දිනෙන් අවසන් සතිය | සතියකට පෙර | බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය බැංකු අනුව | 2019 ජූනි 21 දිනෙන් අවසන් සතිය | සතියකට පෙර |
|---|---|---|---|---|---|
| ලංකා බැංකුව | 12.55 | 12.59 | එච්එස්බීසී බැංකුව | 9.12 | 9.09 |
| මහජන බැංකුව | 12.86 | 13.02 | ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව | 11.09 | 11.09 |
| හැටන් නැෂනල් බැංකුව | 11.54 | 11.81 | සිටි බැංකුව | 10.97 | 10.97 |
| කොමර්ෂල් බැංකුව | 11.90 | 11.46 | ඩොයිෂ් බැංකුව | 10.93 | 10.87 |
| සම්පත් බැංකුව | 13.57 | 12.73 | හබීබ් බැංකුව | 12.73 | 12.73 |
| සෙලාන් බැංකුව | 12.31 | 12.64 | ඉන්දියන් බැංකුව | 13.51 | 13.51 |
| යුනියන් බැංකුව | 14.05 | 13.46 | ඉන්දියන් ඕවර්සීස් බැංකුව | 14.01 | 14.01 |
| පෑන් ඒෂියා බැංකුව | 16.50 | 16.00 | එම්සීබී බැංකුව | 12.65 | 12.65 |
| නේෂන් ට්‍රස්ට් බැංකුව | 11.60 | 11.93 | ඉන්දීය රාජ්‍ය බැංකුව | 11.21 | 11.21 |
| ඩීඑෆ්සීසී බැංකුව | 12.91 | 12.97 | පබ්ලික් බැංකුව | 13.41 | 12.85 |
| එන්ඩීබී බැංකුව | 13.18 | 12.74 | අයිසීඅයිසීඅයි බැංකුව | 12.39 | 12.39 |
| අමානා බැංකුව | 12.31 | 12.38 | ඇක්සිස් බැංකුව | 13.01 | 13.01 |
| කාර්ගිල්ස් බැංකුව | 13.54 | 13.94 | | | |

## 2.2 මුදල් සැපයුම

| අයිතමය | රු. බිලියන | | | වාර්ෂික වෙනස (%) | | |
|---|---|---|---|---|---|---|
| | 2019 අප්‍රේල්(අ) | මසකට පෙර | වසරකට පෙර | 2019 අප්‍රේල්(අ) | මසකට පෙර | වසරකට පෙර |
| සංචිත මුදල් | 924.2 | 962.9 | 1,000.1 | -7.6 | -3.4 | 12.9 |
| පටු මුදල් සැපයුම ($M_1$) | 828.3 | 853.6 | 812.5 | 1.9 | 1.5 | 6.2 |
| පුළුල් මුදල් සැපයුම ($M_2$) | 6,585.5 | 6,550.0 | 6,043.7 | 9.0 | 9.2 | 17.4 |
| ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම ($M_{2b}$) | 7,294.2 | 7,252.1 | 6,691.7 | 9.0 | 9.8 | 16.8 |
| බැංකු පද්ධතිය සතු ශුද්ධ විදේශීය වත්කම් (ආ) | 109.1 | 21.9 | 119.4 | -8.6 | -79.4 | 135.0 |
| මුදල් අධිකාරීන් | 771.3 | 691.9 | 835.2 | -7.7 | -19.4 | 63.4 |
| වාණිජ බැංකු | -662.1 | -670.0 | -715.8 | 7.5 | 11.0 | 16.0 |
| දේශීය බැංකු ඒකක (DBUs) | -268.3 | -291.7 | -340.0 | 21.1 | 13.5 | -5.8 |
| අක්වෙරළ බැංකු ඒකක (OBUs) | -393.8 | -378.3 | -375.8 | -4.8 | 8.9 | 29.2 |
| බැංකු පද්ධතිය සතු ශුද්ධ දේශීය වත්කම් (ආ) | 7,185.1 | 7,230.2 | 6,572.3 | 9.3 | 11.2 | 8.2 |
| රජයේ ණය ගැනීම් (ශුද්ධ) | 2,593.9 | 2,612.8 | 2,322.5 | 11.7 | 14.7 | 5.3 |
| මහ බැංකුව | 444.2 | 503.2 | 291.8 | 52.2 | 92.1 | -38.8 |
| වාණිජ බැංකු | 2,149.6 | 2,109.5 | 2,030.7 | 5.9 | 4.6 | 17.4 |
| දේශීය බැංකු ඒකක (DBUs) | 1,772.8 | 1,733.5 | 1,656.0 | 7.1 | 5.0 | 22.8 |
| අක්වෙරළ බැංකු ඒකක (OBUs) | 376.8 | 376.0 | 374.6 | 0.6 | 2.8 | -1.6 |
| රාජ්‍ය සංස්ථාවලට දෙන ලද ණය | 725.7 | 702.6 | 581.0 | 24.9 | 26.2 | 0.8 |
| දේශීය බැංකු ඒකක (DBUs) | 450.3 | 436.2 | 362.2 | 24.3 | 21.4 | 12.7 |
| අක්වෙරළ බැංකු ඒකක (OBUs) | 275.4 | 266.4 | 218.9 | 25.9 | 34.8 | -14.1 |
| පෞද්ගලික අංශයට දෙන ලද ණය | 5,544.3 | 5,587.7 | 5,044.5 | 9.9 | 11.3 | 15.3 |
| දේශීය බැංකු ඒකක (DBUs) | 5,139.4 | 5,182.0 | 4,684.4 | 9.7 | 11.1 | 15.2 |
| අක්වෙරළ බැංකු ඒකක (OBUs) | 404.9 | 405.7 | 360.0 | 12.5 | 13.6 | 16.8 |
| අනෙකුත් අයිතම (ශුද්ධ) | -1,678.8 | -1,672.9 | -1,375.7 | -22.0 | -23.3 | -26.7 |

(අ) තාවකාලික (ආ) ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුමට ($M_{2b}$) අදාළව










## 2.3 සංචිත මුදල්හි සතිපතා වෙනස

| අයිතමය | 2019 ජූනි 20 | සතියකට පෙර | වෙනස |
|---|---|---|---|
| සංචිත මුදල් (රුපියල් මිලියන) | 880,073.13 | 863,727.36 | 16,345.77 |




## 2.4 මුදල් වෙළෙඳපොළ ක්‍රියාකාරකම් (දෛනික)

| අයිතමය | 17.06.2019 | 18.06.2019 | 19.06.2019 | 20.06.2019 | 21.06.2019 |
|---|---|---|---|---|---|
| **ඒක්ෂණ මුදල් වෙළෙඳපොළ** | | | | | |
| බරිත සාමාන්‍ය අනුපාතිකය (වාර්ෂික පොලී අනුපාතිකය සියයට) | 7.95 | 7.97 | 7.96 | 7.97 | 7.95 |
| දළ වටිනාකම (රුපියල් මිලියන) | 24,550 | 25,075 | 25,255 | 25,615 | 19,755 |
| **වෙළෙඳපොළ ප්‍රතිමිලදී ගැනුම්** | | | | | |
| බරිත සාමාන්‍ය අනුපාතිකය (වාර්ෂික පොලී අනුපාතිකය සියයට) | 7.98 | 7.97 | 7.98 | 7.98 | 7.98 |
| දළ වටිනාකම (රුපියල් මිලියන) | 20,932 | 23,594 | 19,294 | 19,400 | 20,115 |

## 2.5 ශ්‍රී ලංකා මහ බැංකුව සතු සුරැකුම්පත් ගොනුව

| අයිතමය | 17.06.2019 | 18.06.2019 | 19.06.2019 | 20.06.2019 | 21.06.2019 |
|---|---|---|---|---|---|
| ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය - මුහුණත අගය (රුපියල් මිලියන) | 129,088.43 | 129,088.43 | 129,088.43 | 129,088.43 | 128,088.43 |
| ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය - පොත් අගය (රුපියල් මිලියන) | 125,766.50 | 125,781.66 | 125,835.42 | 125,873.46 | 124,914.43 |

## 2.6 විවට වෙළඳ කටයුතු

| අයිතමය | 17.06.2019 | 18.06.2019 | 19.06.2019 | 20.06.2019 | | 21.06.2019 |
|---|---|---|---|---|---|---|
| **කෙටි කාලීන වෙන්දේසි** | | | | | | |
| පිරිනමන ලද ප්‍රතිමිලදී ගැනුම් ප්‍රමාණය (රු. බිලියන) | | | 10.00 | 8.00 | 10.00 | 10.00 |
| පිරිනමන ලද ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන) | | | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| කාල සීමාව (දින ගණන) | | | 1 | 1 | 6 | 5 |
| ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන) | | | 17.43 | 16.50 | 11.50 | 16.90 |
| පිළිගත් ප්‍රමාණය (රු. බිලියන) | | | 10.00 | 8.00 | 10.00 | 10.00 |
| අවම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | 7.75 | 7.74 | 7.79 | 7.78 |
| උපරිම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | 7.78 | 7.75 | 7.80 | 7.80 |
| බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | 7.77 | 7.75 | 7.80 | 7.79 |
| **ස්ථිර පදනම මත වෙන්දේසි** | | | | | | |
| ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් විකිණීම (රු. බිලියන) | | | | | | |
| ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනුම් (රු. බිලියන) | | | | | | |
| පියවීමේ දිනය | | | | | | |
| පරිණත වන දිනය | | | | | | |
| කාල සීමාව (දින ගණන) | | | | | | |
| ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන) | | | | | | |
| පිළිගත් ප්‍රමාණය (රු. බිලියන) | | | | | | |
| අවම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | | |
| උපරිම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | | |
| බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | | |
| **දිගු කාලීන වෙන්දේසි** | | | | | | |
| පිළිගත් ප්‍රතිමිලදී ගැනුම් ප්‍රමාණය (රු. බිලියන) | 7.00 | | | | | |
| පිළිගත් ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන) | 0.00 | | | | | |
| පියවීමේ දිනය | 18-Jun-19 | | | | | |
| පරිණත වන දිනය | 26-Jun-19 | | | | | |
| කාල සීමාව (දින ගණන) | 8 | | | | | |
| ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන) | 7.00 | | | | | |
| පිළිගත් ප්‍රමාණය (රු. බිලියන) | 7.00 | | | | | |
| අවම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | 7.90 | | | | | |
| උපරිම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | 7.90 | | | | | |
| බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය (වා.පො.අ. සියයට) | 7.90 | | | | | |
| **නිත්‍ය පහසුකම** | | | | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම (රු. බිලියන) | 31.61 | 29.91 | 29.66 | 21.87 | | 20.30 |
| නිත්‍ය ණය පහසුකම (රු. බිලියන) | 18.45 | 17.69 | 15.35 | 15.18 | | 14.17 |
| **සමස්ත වෙළෙඳපොළ ද්‍රවශීලතාව (රු. බිලියන)** | **43.52** | **43.57** | **48.07** | **42.19** | | **43.64** |

## 2.7 ණය කාඩ්පත් (අ)

| අයිතමය | 2019<br>මැයි අවසානයට (ආ) | 2019<br>අප්‍රේල් අවසානයට | 2018<br>දෙසැ. අවසානයට |
|---|---|---|---|
| මුළු සක්‍රිය කාඩ්පත් ගණන | 1,722,253 | 1,712,867 | 1,648,884 |
| දේශීය (දේශීය වශයෙන් පිළිගත් ඒවා පමණි) | 21,533 | 21,689 | 20,638 |
| ගෝලීය (ගෝලීය වශයෙන් පිළිගත්) | 1,700,720 | 1,691,178 | 1,628,246 |
| නොපියවූ ශේෂය (රුපි. මිලියන) | 108,764 | 110,275 | 107,814 |
| දේශීය (දේශීය වශයෙන් පිළිගත් ඒවා පමණි) | 26,245 | 26,158 | 25,836 |
| ගෝලීය (ගෝලීය වශයෙන් පිළිගත්) | 82,518 | 84,117 | 81,978 |

(අ) බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් නිකුත් කරන ලද (ආ) තාවකාලික

## 2.8 වාණිජ පත්‍රිකා නිකුතු (අ)

| අයිතමය (රු.බිලියන) | 2019<br>අප්‍රේල් අවසානයට (ආ) | 2019<br>මාර්තු අවසානයට | 2018<br>අප්‍රේල් අවසානයට |
|---|---|---|---|
| සමස්ත නිකුතුව (සමුච්චිත) | 0.9 | 0.4 (ඇ) | 1.0 |
| නොපියවූ (කාලපරිච්ඡේදය අවසානය වනවිට) | 1.8 | 1.4 | 1.7 |

(අ) බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සපයන ලද දත්ත මත පදනම්ව

(ආ) තාවකාලික (ඇ) සංශෝධිත







## 2.9 කොටස් වෙළඳපොළ

| අයිතමය | 2019 ජුනි 21 දිනෙන් අවසන් වන සතිය | සතියකට පෙර | වසරකට පෙර |
|---|---|---|---|
| සමස්ත කොටස් මිල දර්ශකය<br>(1985 = 100) (ASPI) | 5,363.5 | 5,383.7 | 6,228.2 |
| එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 දර්ශකය<br>(2004 = 1,000) (S&P SL20) | 2,489.0 | 2,512.7 | 3,428.0 |
| දෛනික සාමාන්‍ය පිරිවැටුම(රුපි. මිලියන) | 890.7 | 423.6 | 593.2 |
| වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය (රුපි. බිලියන) | 2,522.8 | 2,536.9 | 2,909.4 |
| විදේශීය මිලදී ගැනීම්(රුපි. මිලියන) | 4.1 | 18.5 | 50.1 |
| විදේශීය විකිණුම් (රුපි. මිලියන) | 35.3 | 79.9 | 122.8 |
| ශුද්ධ විදේශ මිලදී ගැනීම් (රුපි. මිලියන) | -31.2 | -61.4 | -72.7 |

# රාජ්‍ය මූල්‍ය අංශය

## 3.1 රාජ්‍ය මූල්‍ය කටයුතු (රු. බිලියන)

| ශීර්ෂය | 2018 ජන. | 2019 ජන. [(අ)] |
|---|---|---|
| **ආදායම් සහ ප්‍රදාන** | **151.1** | **149.9** |
| ආදායම | 150.9 | 149.9 |
| බදු ආදායම | 141.7 | 139.6 |
| බදු නොවන | 9.2 | 10.4 |
| ප්‍රදාන | 0.2 | 0.0 |
| **වියදම් සහ ආපසු ගෙවීම් අඩු කළ පසු ශුද්ධ ණයදීම්** | **273.1** | **253.5** |
| පුනරාවර්තන | 196.1 | 213.0 |
| ප්‍රාග්ධන වියදම් සහ ආපසු ගෙවීම් අඩු කළ පසු ශුද්ධ ණය දීම් | 77.0 | 40.5 |

(අ)තාවකාලික




## 3.2 මධ්‍යම රජයේ නොපියවූ ණය (රු. බිලියන)

| ශීර්ෂය | 2018 වසර අවසානයට | 2019 ජන. අවසානයට[(අ)] |
|---|---|---|
| **සමස්ත දේශීය ණය** | **6,018.0** | **6,202.9** |
| එයින් | | |
| භාණ්ඩාගාර බිල්පත් | 746.9 | 904.1 |
| භාණ්ඩාගාර බැඳුම්කර | 4,140.7 | 4,161.6 |
| රුපියල් ණය | 24.1 | 24.1 |
| සමස්ත විදේශීය ණය | 5,959.5 | 5,736.8 |
| මධ්‍යම රජයේ සමස්ත නොපියවූ රාජ්‍ය ණය | 11,977.5 | 11,939.7 |

(අ)තාවකාලික




## 3.3 රාජ්‍ය සුරැකුම්පත් - ප්‍රාථමික හා ද්විතියික වෙළෙඳපොළ ඵලදා අනුපාත 2019.06.19 දිනෙන් අවසන් සතියට

| සුරැකුම්පත | පරිණත කාලය | ප්‍රාථමික වෙළෙඳපොළ [(අ)] | | ද්විතියික වෙළෙඳපොළ [(ආ)] | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | මෙම සතිය | | | පසුගිය සතියේ සාමාන්‍යය |
| | | මෙම සතිය | පසුගිය සතිය | මිලට ගැනීමේ අනුපාතය | විකුණුම් අනුපාතය | සාමාන්‍යය | |
| භාණ්ඩාගාර බිල්පත් | මාස 03 | 8.38% | 8.38% | 8.47% | 8.31% | 8.39% | 8.38% |
| | මාස 06 | 8.60% | 8.63% | 8.68% | 8.53% | 8.61% | 8.61% |
| | මාස 12 | 8.86% | - | 8.91% | 8.76% | 8.83% | 8.85% |
| භාණ්ඩාගාර බැඳුම්කර(ආ) | < වසර 02 | - | - | 9.61% | 9.49% | 9.55% | 9.50% |
| | < වසර 03 | 9.79% | - | 10.05% | 9.89% | 9.97% | 10.06% |
| | < වසර 05 | - | - | 10.33% | 10.20% | 10.26% | 10.20% |
| | < වසර 06 | - | - | 10.46% | 10.34% | 10.40% | 10.37% |
| | < වසර 08 | - | - | 10.56% | 10.45% | 10.50% | 10.48% |
| | < වසර 10 | 10.63% | - | 10.69% | 10.58% | 10.64% | 10.62% |
| | < වසර 15 | - | - | 10.86% | 10.75% | 10.80% | 10.78% |
| | < වසර 20 | - | - | 11.03% | 10.88% | 10.95% | 10.82% |
| | < වසර 30 | - | - | 11.19% | 10.98% | 11.09% | 10.89% |

(අ) 2019.06.19 දිනෙන් අවසන් සතිය තුල සිදුවූ ප්‍රාථමික වෙළෙඳපොළ ගනුදෙනු

(ආ) ද්විතික වෙළෙඳපොල තුල ඉදිරිපත්කල ඵලදා අනුපතිකයන්ගේ මධ්‍යනය

**පසුගිය සතියට සාපේක්ෂව මෙම සතිය තුළදී භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර ද්විතීයික වෙළඳපොළ ඵලදා අනුපාත මිශ්‍ර හැසිරීමක් පෙන්නුම් කර ඇත.**

| සුරැකුම්පත | පරිණත දිනය | කූපන් අනුපාතය | ද්විතියික වෙළෙඳපොළ | |
|---|---|---|---|---|
| | | | මෙම සතිය | පසුගිය සතිය |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | 2020 ඔක්. 4 | 6.250% | 5.25% | 5.53% |
| | 2021 ජූලි 27 | 6.250% | 5.63% | 5.83% |
| | 2022 ජන. 18 | 5.750% | 5.74% | 5.97% |
| | 2022 ජූලි 25 | 5.875% | 5.87% | 6.07% |
| | 2023 අප්‍රේල් 18 | 5.750% | 6.03% | 6.26% |
| | 2024 මාර්තු. 14 | 6.850% | 6.33% | 6.61% |
| | 2025 ජූනි 3 | 6.125% | 6.71% | 6.93% |
| | 2025 නොවැ. 3 | 6.850% | 6.79% | 7.00% |
| | 2026 ජූලි 18 | 6.825% | 6.90% | 7.14% |
| | 2027 මැයි 11 | 6.200% | 6.96% | 7.23% |
| | 2028 අප්‍රේල් 18 | 6.750% | 7.13% | 7.32% |
| | 2029 මාර්තු 14 | 7.850% | 7.28% | 7.51% |






### 3.4 රාජ්‍ය සුරැකුම්පත්- 2019.06.19 දිනෙන් අවසන් සතියට ප්‍රාථමික හා ද්විතියික වෙළෙඳපොළ ගනුදෙනු සාරාංශය

| අයිතමය | ප්‍රමාණය (රු. මිලියන) | |
|---|---|---|
| | මෙම සතිය | පසුගිය සතිය |
| නොපියවූ රාජ්‍ය ණය සුරැකුම්පත් | | |
| භාණ්ඩාගාර බිල්පත් | 917,810.13 | 918,845.13 |
| භාණ්ඩාගාර බැදුම්කර[(අ)] | 4,560,877.55 | 4,490,877.55 |
| **එකතුව** | **5,478,687.68** | **5,409,722.68** |
| අනේවාසිකයින් සතු භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැදුම්කර | 143,830.88 | 142,951.24 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැදුම්කර | 548,042.07 | 546,888.18 |

**මෙම සතිය තුලදී අනේවාසිකයන් සතු නොපියවූ භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැදුම්කර ප්‍රමාණය 0.62 ප්‍රතිශතයකින් වැඩිවීමක් පෙන්නුම් කෙරේ.**

| ප්‍රාථමික වෙළෙඳපොළ ක්‍රියාකාරකම් | ප්‍රමාණය (රු. මිලියන) | |
|---|---|---|
| | මෙම සතිය | පසුගිය සතිය |
| භාණ්ඩාගාර බිල්පත් | | |
| ඉදිරිපත් කළ ප්‍රමාණය | 19,000.00 | 19,000.00 |
| ලැබුණු ලංසු ප්‍රමාණය | 61,270.00 | 52,716.00 |
| පිළිගත් ලංසු ප්‍රමාණය | 19,000.00 | 17,734.00 |
| භාණ්ඩාගාර බැදුම්කර | | |
| ඉදිරිපත් කළ ප්‍රමාණය | 70,000.00 | - |
| ලැබුණු ලංසු ප්‍රමාණය | 194,082.00 | - |
| පිළිගත් ලංසු ප්‍රමාණය | 70,000.00 | - |

**මෙම සතිය තුලදී පවත්වන ලද භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසිය සදහා ලැබුණු මුළු ලංසු ප්‍රමාණය ඉදිරිපත් කළ මුළු ලංසු ප්‍රමාණය මෙන්3.2 ගුණයක් වූ අතර භාණ්ඩාගාර බැදුම්කර වෙන්දේසිය සදහා ලැබුණු මුළු ලංසු ප්‍රමාණය ඉදිරිපත් කළ මුළු ලංසු ප්‍රමාණය මෙන් 2.8 ගුණයක් විය.**

| ද්විතියික වෙළෙඳපොළ ක්‍රියාකාරකම් | ප්‍රමාණය (රු. මිලියන) | |
|---|---|---|
| | මෙම සතිය | පසුගිය සතිය |
| භාණ්ඩාගාර බිල්පත් | | |
| හිමිකම මත පැවරූ ගණුදෙනු (විකුණුම් / මිලදී ගැනුම්) | 12,714.48 | 11,008.29 |
| ප්‍රති මිලදී ගැනුම් ගණුදෙනු (විකුණුම් / මිලදී ගැනුම්) | 137,080.60 | 143,758.12 |
| භාණ්ඩාගාර බැදුම්කර | | |
| හිමිකම මත පැවරූ ගණුදෙනු (විකුණුම් / මිලදී ගැනුම්) | 56,524.58 | 57,318.20 |
| ප්‍රති මිලදී ගැනුම් ගණුදෙනු (විකුණුම් / මිලදී ගැනුම්) | 487,432.19 | 456,664.00 |

**පසුගිය සතියට සාපේක්ෂව මෙම සතිය තුළදී භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැදුම්කර, මුළු ද්විතියික වෙළඳපොළ ගනුදෙනු ප්‍රමාණය 3.74 ප්‍රතිශතයක වැඩිවීමක් පෙන්නුම් කර ඇත.**

(අ) ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව වෙත නිකුත් කරන ලද වටිනාකම රු. මිලියන 56,662 ක් වන භාණ්ඩාගාර බැදුම්කර ඇතුලත් නොවේ.

### 3.5 ද්වි පාර්ශ්වීය මිල ගණන් (භාණ්ඩාගාර බිල්පත් ) -2019/06/21

| පරිණතියට ඇති ඉතිරි කාලය | සාමාන්‍ය මිලට ගැනීමේ මිල | ඵලදා අනුපාතය % | සාමාන්‍ය විකුණුම් මිල | ඵලදා අනුපාතය % | ගැණුම් හා විකුණුම් මිල පරතරය |
|---|---|---|---|---|---|
| 1-7 දින | 99.84 | 8.24 | 99.85 | 8.06 | 0.00 |
| මාස 1 | 99.31 | 8.34 | 99.33 | 8.19 | 0.01 |
| මාස 2 | 98.62 | 8.39 | 98.65 | 8.24 | 0.02 |
| මාස 3 | 97.92 | 8.44 | 97.95 | 8.30 | 0.04 |
| මාස 4 | 97.20 | 8.51 | 97.25 | 8.36 | 0.05 |
| මාස 5 | 96.46 | 8.61 | 96.53 | 8.44 | 0.07 |
| මාස 6 | 95.72 | 8.67 | 95.80 | 8.51 | 0.08 |
| මාස 7 | 94.99 | 8.70 | 95.08 | 8.56 | 0.08 |
| මාස 8 | 94.26 | 8.73 | 94.35 | 8.59 | 0.09 |
| මාස 9 | 93.55 | 8.75 | 93.64 | 8.63 | 0.09 |
| මාස 10 | 92.80 | 8.78 | 92.90 | 8.66 | 0.10 |
| මාස 11 | 92.06 | 8.81 | 92.16 | 8.69 | 0.10 |
| මාස 12 | 91.28 | 8.87 | 91.41 | 8.74 | 0.13 |

## 3.6 ද්වි පාර්ශ්වීය මිල ගණන් (භාණ්ඩාගාර බැදුම්කර ) - 2019/06/21

| භාණ්ඩාගාර බැදුම්කර කාණ්ඩය | පරිණත කාලය (වසර ගණන) | පරිණත දිනය (දිනය/මාසය /වර්ෂය ) | පරිණතියට ඇති දින ගණන | සාමාන්‍ය මිලට ගැනීමේ මිල | ඵලදා අනුපාතය % | සාමාන්‍ය විකුණුම් මිල | ඵලදා අනුපාතය % | ගැණුම් හා විකුණුම් මිල පරතරය |
|---|---|---|---|---|---|---|---|---|
| 10.60%2019A | 5 | 2019 ජූලි 1 | 10 | 100.05 | 8.43 | 100.05 | 8.26 | 0.00 |
| 10.60%2019B | 5 | 2019 සැප්. 15 | 86 | 100.41 | 8.56 | 100.45 | 8.41 | 0.04 |
| 08.00%2019A | 8 | 2019 නොවැ. 1 | 133 | 99.76 | 8.60 | 99.82 | 8.43 | 0.06 |
| 09.25%2020A | 5 | 2020 මැයි 1 | 315 | 100.30 | 8.86 | 100.40 | 8.73 | 0.11 |
| 08.00%2020A | 8 | 2020 ජූනි 1 | 346 | 99.10 | 9.00 | 99.21 | 8.88 | 0.11 |
| 06.20%2020A | 10 | 2020 අගෝ. 1 | 407 | 97.03 | 9.05 | 97.17 | 8.92 | 0.14 |
| 09.50%2020A | 5 | 2020 දෙසැ. 15 | 543 | 100.49 | 9.13 | 100.68 | 9.00 | 0.18 |
| 10.75%2021A | 5 | 2021 මාර්තු. 1 | 619 | 101.80 | 9.56 | 102.02 | 9.42 | 0.22 |
| 09.00%2021A | 8 | 2021 මැයි 1 | 680 | 99.00 | 9.59 | 99.21 | 9.46 | 0.21 |
| 11.00%2021A | 7 | 2021 අගෝ. 1 | 772 | 102.50 | 9.65 | 102.72 | 9.54 | 0.22 |
| 09.45%2021A | 7 | 2021 ඔක්. 15 | 847 | 99.48 | 9.69 | 99.70 | 9.58 | 0.22 |
| 11.50%2021A | 5 | 2021 දෙසැ. 15 | 908 | 103.85 | 9.72 | 104.07 | 9.62 | 0.22 |
| 08.00%2022A | 10 | 2022 ජන. 1 | 925 | 95.94 | 9.85 | 96.29 | 9.69 | 0.35 |
| 10.70%2022A | 3 | 2022 මාර්තු. 15 | 998 | 101.81 | 9.91 | 102.10 | 9.79 | 0.29 |
| 11.20%2022A | 9 | 2022 ජූලි 1 | 1106 | 103.06 | 10.00 | 103.48 | 9.84 | 0.41 |
| 10.00%2022A | 8 | 2022 ඔක්. 1 | 1198 | 99.86 | 10.04 | 100.22 | 9.91 | 0.37 |
| 10.00%2023A | 6 | 2023 මාර්තු. 15 | 1363 | 99.62 | 10.12 | 99.94 | 10.01 | 0.32 |
| 11.50%2023A | 6 | 2023 මැයි 15 | 1424 | 104.29 | 10.13 | 104.70 | 10.01 | 0.41 |
| 10.20%2023A | 5 | 2023 ජූලි 15 | 1485 | 100.12 | 10.16 | 100.54 | 10.03 | 0.43 |
| 09.00%2023A | 10 | 2023 සැප්. 1 | 1533 | 96.02 | 10.18 | 96.47 | 10.04 | 0.45 |
| 11.20%2023A | 9 | 2023 සැප්. 1 | 1533 | 103.33 | 10.20 | 103.81 | 10.06 | 0.48 |
| 07.00%2023A | 20 | 2023 ඔක්. 1 | 1563 | 89.07 | 10.21 | 89.51 | 10.07 | 0.44 |
| 11.60%2023A | 5 | 2023 දෙසැ. 15 | 1638 | 104.90 | 10.21 | 105.37 | 10.08 | 0.47 |
| 11.40%2024A | 10 | 2024 ජන. 1 | 1655 | 103.99 | 10.27 | 104.45 | 10.15 | 0.46 |
| 10.90%2024A | 5 | 2024 මාර්තු. 15 | 1729 | 102.36 | 10.25 | 102.65 | 10.17 | 0.29 |
| 11.00%2024A | 8 | 2024 අගෝ. 1 | 1868 | 102.57 | 10.33 | 103.14 | 10.19 | 0.56 |
| 06.00%2024A | 10 | 2024 දෙසැ. 1 | 1990 | 82.16 | 10.37 | 82.65 | 10.23 | 0.48 |
| 10.25%2025A | 10 | 2025 මාර්තු. 15 | 2094 | 99.44 | 10.38 | 99.97 | 10.25 | 0.53 |
| 09.00%2025A | 12 | 2025 මැයි 1 | 2141 | 93.71 | 10.46 | 94.26 | 10.32 | 0.55 |
| 11.00%2025A | 10 | 2025 අගෝ. 1 | 2233 | 102.39 | 10.46 | 102.97 | 10.33 | 0.58 |
| 10.35%2025A | 8 | 2025 ඔක්. 15 | 2308 | 99.35 | 10.49 | 99.88 | 10.37 | 0.53 |
| 09.00%2026A | 13 | 2026 පෙබ. 1 | 2417 | 92.69 | 10.56 | 93.36 | 10.41 | 0.67 |
| 05.35%2026A | 15 | 2026 මාර්තු. 1 | 2445 | 75.27 | 10.60 | 75.87 | 10.45 | 0.60 |
| 11.00%2026A | 11 | 2026 ජූනි 1 | 2537 | 102.51 | 10.48 | 103.15 | 10.35 | 0.64 |
| 11.50%2026A | 10 | 2026 අගෝ. 1 | 2598 | 104.75 | 10.53 | 105.36 | 10.41 | 0.61 |
| 11.40%2027A | 8 | 2027 ජන. 15 | 2765 | 104.12 | 10.59 | 104.71 | 10.48 | 0.60 |
| 11.75%2027A | 10 | 2027 ජූනි 15 | 2916 | 106.00 | 10.62 | 106.75 | 10.48 | 0.75 |
| 11.25%2027A | 10 | 2027 දෙසැ. 15 | 3099 | 103.18 | 10.67 | 104.03 | 10.52 | 0.85 |
| 10.75%2028A | 10 | 2028 මාර්තු. 15 | 3190 | 100.44 | 10.67 | 101.15 | 10.54 | 0.71 |
| 09.00%2028B | 15 | 2028 මැයි 1 | 3237 | 90.36 | 10.71 | 91.16 | 10.56 | 0.80 |
| 09.00%2028A | 15 | 2028 ජූලි 1 | 3298 | 90.27 | 10.71 | 91.07 | 10.56 | 0.80 |
| 11.50%2028A | 13 | 2028 සැප්. 1 | 3360 | 104.82 | 10.66 | 105.77 | 10.50 | 0.95 |
| 13.00%2029A | 15 | 2029 ජන. 1 | 3482 | 113.22 | 10.75 | 113.98 | 10.63 | 0.75 |
| 13.00%2029B | 15 | 2029 මැයි 1 | 3602 | 113.77 | 10.70 | 114.60 | 10.58 | 0.83 |
| 11.00%2030A | 15 | 2030 මැයි 15 | 3981 | 101.27 | 10.80 | 102.15 | 10.66 | 0.88 |
| 11.25%2031A | 12 | 2031 මාර්තු. 15 | 4285 | 102.68 | 10.84 | 103.35 | 10.74 | 0.67 |
| 08.00%2032A | 20 | 2032 ජන. 1 | 4577 | 80.72 | 10.85 | 81.30 | 10.75 | 0.58 |
| 09.00%2032A | 20 | 2032 ඔක්. 1 | 4851 | 87.02 | 10.87 | 87.65 | 10.77 | 0.63 |
| 11.20%2033A | 15 | 2033 ජන. 15 | 4957 | 102.41 | 10.85 | 103.56 | 10.69 | 1.15 |
| 09.00%2033A | 20 | 2033 ජූනි 1 | 5094 | 86.52 | 10.90 | 86.84 | 10.85 | 0.32 |
| 13.25%2033A | 20 | 2033 ජූලි 1 | 5124 | 115.81 | 11.01 | 117.01 | 10.86 | 1.19 |
| 09.00%2033B | 20 | 2033 නොවැ. 1 | 5247 | 85.54 | 11.03 | 86.50 | 10.88 | 0.96 |
| 13.25%2034A | 20 | 2034 ජන. 1 | 5308 | 115.81 | 11.04 | 117.02 | 10.89 | 1.21 |
| 11.50%2035A | 20 | 2035 මාර්තු. 15 | 5746 | 103.66 | 11.00 | 105.21 | 10.80 | 1.54 |
| 12.00%2041A | 25 | 2041 ජන. 1 | 7865 | 106.11 | 11.24 | 108.00 | 11.02 | 1.89 |
| 09.00%2043A | 30 | 2043 ජූනි 1 | 8746 | 81.37 | 11.26 | 82.92 | 11.04 | 1.55 |
| 13.50%2044A | 30 | 2044 ජන. 1 | 8960 | 118.15 | 11.30 | 120.48 | 11.06 | 2.33 |
| 13.50%2044B | 30 | 2044 ජූනි 1 | 9112 | 117.72 | 11.35 | 120.34 | 11.08 | 2.62 |
| 12.50%2045A | 30 | 2045 මාර්තු. 1 | 9385 | 109.95 | 11.30 | 112.73 | 11.00 | 2.78 |

# විදේශීය අංශය

## 4.1 විනිමය අනුපාතික

| අයිතමය | 2019 ජුනි 21 දිනෙන් අවසන් සතිය | | | සාමාන්‍යය අනුපාතිකය | |
|---|---|---|---|---|---|
| (ඒකකයකට රුපියල්)[අ] | ගැනුම් මිල | විකුණුම් මිල | සාමාන්‍යය අනුපාතිකය | සතියකට පෙර | වසරකට පෙර |
| එ.ජ. ඩොලර් | 174.77 | 178.52 | 176.64 | 176.48 | 159.72 |
| ස්ටර්ලිං පවුම් | 221.15 | 228.28 | 224.71 | 223.78 | 210.33 |
| ජපන් යෙන් | 1.62 | 1.68 | 1.65 | 1.63 | 1.45 |
| යූරෝ | 196.24 | 203.10 | 199.67 | 199.04 | 184.76 |
| ඉන්දියානු රුපියල්[1] | | | 2.47 | 2.54 | 2.35 |
| වි.ගැ.හි. | ( 2019 ජුනි 20 වන දිනට ) | | 245.26 | 244.33 | 225.11 |
| මහ බැංකුව විසින් සිදු කරන ලද මිලදී ගැනීම් සහ විකිණීම්[ආ](එ.ජ. ඩොලර් මිලියන ) | | | 2019 මැයි | මාසයකට පෙර | වසරකට පෙර |
| මිලදී ගැනීම් | | | 45.00 | 51.20 | 30.75 |
| විකිණීම් | | | 40.50 | 34.50 | 220.85 |




| අයිතමය | 2019 ජුනි 21 දිනෙන් අවසන් සතිය | මාසයකට පෙර | වසරකට පෙර |
|---|---|---|---|
| සාමාන්‍ය දෛනික අන්තර් බැංකු ගනුදෙනු පරිමාව (එ.ජ. ඩොලර් මිලියන) | 52.88 | 51.11 | 39.31 |
| (වාණිජ බැංකු අතර සිදුවන එතැන්, පසුදින සහ එදින ගනුදෙනු) | | | |
| ඉදිරි විනිමය ගනුදෙනු | | | |
| ඉදිරි විනිමය අනුපාතික (රු/එ.ජ. ඩොලර්)[2] | | | |
| මාස 1 | 177.53 | 177.20 | 160.65 |
| මාස 3 | 179.09 | 178.62 | - |
| සාමාන්‍ය දෛනික අන්තර් බැංකු ගනුදෙනු පරිමාව (එ.ජ. ඩොලර් මිලියන) | 35.87 | 42.32 | 24.10 |
| නොපියවූ ඉදිරි විනිමය ගනුදෙනු පරිමාව (එ.ජ. ඩොලර් මිලියන) (2019 ජුනි 20 දිනට) | 2,157.48 | 2,103.08 | 2,349.81 |

(අ) වාණිජ බැංකුවල සාමාන්‍ය මධ්‍යස්ථ අනුපාතිකය (පෙ.ව.9.30 ට පවතින)

(ආ) මාසය තුළ මහ බැංකුව විසින්, වාණිජ බැංකු වෙතින් වෙළඳපොළ මිලට සිදු කරනු ලබන සමස්ත විකිණීම් සහ මිලදී ගැනීම්

(1) මහ බැංකුවේ දෛනික විනිමය අනුපාතිකය (2) සැබෑ ගනුදෙනු මත පදනම් වූ සතියේ සාමාන්‍යය

## 4.2 සංචාරක සේවා සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ

| අයිතමය | | 2018 අප්‍රේල් | 2019 අප්‍රේල්[අ] | 2018 ජන-අප්‍රේ. | 2019 ජන-අප්‍රේ.[අ] | % වෙනස |
|---|---|---|---|---|---|---|
| සංචාරක පැමිණීම් | සංඛ්‍යාව | 180,429 | 166,975 | 888,353 | 907,575 | 2.2 |
| සංචාරක ඉපැයීම් | (එ.ජ. ඩොලර් මිලියන) | 338.7 [ආ] | 313.4 [ඇ] | 1,667.5 [ආ] | 1,703.6 [ඇ] | 2.2 |
| | (රුපියල් බිලියන) | 52.9 [ආ] | 54.8 [ඇ] | 258.6 [ආ] | 304.7 [ඇ] | 17.8 |
| | | 2018 මැයි | 2019 මැයි[අ] | 2018 ජන-මැයි[ආ] | 2019 ජන-මැයි[අ] | % වෙනස |
| විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම් | (එ.ජ. ඩොලර් මිලියන) | 580.4 | 562.1 | 3,100.1 | 2,733.1 | -11.8 |
| | (රුපියල් බිලියන) | 91.6 | 99.2 | 482.4 | 486.7 | 0.9 |

(අ) තාවකාලික

(ආ) සංචාරකයෙකු මෙරට ගත කළ සාමාන්‍ය දින ගණන සහ දිනක් සඳහා වන වියදම පිළිබඳ සංචාරක සංවර්ධන අධිකාරිය විසින් සිදු කරන සමීක්ෂණයේ ප්‍රතිඵල මත සංශෝධනය විය හැකිය.

(ඇ) 2019 වසරේදී සංචාරකයෙකු මෙරට ගත කරන සාමාන්‍ය දින ගණන සහ දිනක් සඳහා වන වියදම පිළිබඳ සංචාරක සංවර්ධන අධිකාරිය විසින් සිදු කරන සමීක්ෂණයේ ප්‍රතිඵල මත සංශෝධනය විය හැකිය.






## 4.3 2018 මැයි මස 31 දිනට නිල සංචිත වත්කම් (අ)

| | |
|---|---|
| නිල සංචිත වත්කම් (එ.ජ. ඩොලර් මිලියන) | **6,732.4** |
| (1) විදේශ මුදල් සංචිත | 5,824.3 |
| (2) ජා.මූ. අරමුදලේ සංචිත මට්ටම | 65.9 |
| (3) විශේෂ ගැනුම් හිමිකම් | 7.3 |
| (4) රත්‍රන් | 833.8 |
| (5) අනෙකුත් සංචිත වත්කම් | 1.1 |

(අ) තාවකාලික

## 4.4 2018 අප්‍රේල් මස 30 දිනට විදේශ සංචිත සහ විදේශ මුදල් ද්‍රවශීලතාවය (අ)

| නිල සංචිත වත්කම් (එ.ජ. ඩොලර් මිලියන) | |
|---|---|
| නිල සංචිත වත්කම් | **7,213.97** |
| (1) විදේශ මුදල් සංචිත | 6,319.46 |
| (අ) සුරැකුම්පත් | 3,661.00 |
| (ආ) මුළු මුදල් සහ තැන්පතු | 2,658.46 |
| (i) වෙනත් මහ බැංකු, පියවීම් සඳහා වන ජාත්‍යන්තර බැංකුව සහ ජා.මූ.අරමුදල වෙතින් | 968.75 |
| (ii) විදේශයන්හි පිහිටි වාර්තා කරන රට තුළ මූලස්ථානය පිහිටා ඇති බැංකු වෙතින් | 1.16 |
| (iii) වාර්තා කරන රටෙන් පිටත මූලස්ථානය පිහිටා ඇති බැංකු වෙතින් | 1,688.55 |
| (2) ජා.මූ. අරමුදලේ සංචිත මට්ටම | 66.32 |
| (3) විශේෂ ගැනුම් හිමිකම් | 7.37 |
| (4) රත්‍රන් | 819.73 |
| (5) අනෙකුත් සංචිත වත්කම් | 1.09 |

විදේශ සංචිත මගින් ඉදිරියේදී සිදුකළ යුතු කෙටිකාලීන ශුද්ධ ගෙවීම් (ආ) (එ.ජ. ඩොලර් මිලියන)

| අයිතමය | | එකතුව | කල්පිරීම | | |
|---|---|---|---|---|---|
| | | | මාසයක් ඇතුලත | මාස 1 ට වැඩි සහ මාස 3 දක්වා | මාස 3 ට වැඩි සහ වසරක් දක්වා |
| 1. විදේශ ණය, සුරැකුම්පත් සහ තැන්පතු | | | | | |
| ගෙවීම් (–) | ණය වාරික ආපසු ගෙවීම | -3,003.20 | -862.52 | -412.81 | -1,727.88 |
| | පොලිය | -1,736.81 | -174.68 | -310.80 | -1,251.33 |
| ලැබීම් (+) | ණය වාරික ආපසු ලැබීම | | | | |
| | පොලිය | | | | |
| 2. විදේශ මුදලින් සහ දේශීය මුදලින් පවතින ඉදිරි ගිවිසුම් සහ අනාගත සුරැකුම්වල සමස්ත හිඟ සහ අතිරික්ත තත්ත්වය (විනිමය හුවමාරු ගිවිසුම්වල ඉදිරි ගනුදෙනු ද (forward leg) අන්තර්ගතව) | | | | | |
| (i) හිඟ (–)(ඇ) | | -878.31 | | -315.00 | -523.31 |
| (ii) අතිරික්ත (+) | | | | | |
| 3. අනෙකුත් | | -2.52 | -2.52 | | |
| ප්‍රතිමිලදී ගැනීම් හා සම්බන්ධ ලැබීම් (+) | | | | | |
| අනෙකුත් ගෙවිය යුතු ගිණුම් (–) | | -2.52 | -2.52 | | |

(අ) තාවකාලික (ආ) මෙහි මූලික වශයෙන් අන්තර්ගත වන්නේ ඉදිරියේ දී සිදුකළ යුතු ගෙවීම්ය.
(ඇ) ඉදිරි විනිමය හුවමාරු ගිවිසුම්වල වැඩි කොටසක් නොපියවා ඉදිරියට ගෙනයනු ලැබේ.

## 4.5 විදේශීය වෙළඳාම

| අයිතමය | එ.ජ. ඩොලර් මිලියන | | | රුපියල් මිලියන | | |
|---|---|---|---|---|---|---|
| | 2019[අ] ජන.-අප්‍රේ. | 2018 ජන.-අප්‍රේ. | % වෙනස | 2019[අ] ජන.-අප්‍රේ. | 2018 ජන.-අප්‍රේ. | % වෙනස |
| **අපනයන** | **3,954.2** | **3,783.7** | **4.5** | **706,793.8** | **586,902.4** | **20.4** |
| කෘෂිකාර්මික | 824.7 | 843.4 | (2.2) | 147,335.9 | 130,844.7 | 12.6 |
| කාර්මික | 3,111.9 | 2,923.3 | 6.5 | 556,308.5 | 453,408.8 | 22.7 |
| ආහාර, පාන හා දුම්කොළ | 165.2 | 155.0 | 6.5 | 29,573.4 | 24,039.3 | 23.0 |
| රෙදිපිළි හා ඇඟලුම් | 1,831.8 | 1,667.2 | 9.9 | 327,451.4 | 258,580.2 | 26.6 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත | 166.9 | 173.2 | (3.6) | 29,776.6 | 26,850.3 | 10.9 |
| සම් භාණ්ඩ හා රබර් නිෂ්පාදිත | 326.6 | 332.9 | (1.9) | 58,419.3 | 51,633.2 | 13.1 |
| වෙනත් | 621.5 | 594.9 | 4.5 | 111,087.7 | 92,305.8 | 20.3 |
| ඛනිජ අපනයන | 11.3 | 10.3 | 9.6 | 2,023.4 | 1,604.4 | 26.1 |
| වෙනත් අපනයන | 6.3 | 6.7 | (6.5) | 1,126.1 | 1,044.6 | 7.8 |
| **ආනයන** | **6,412.5** | **7,764.6** | **(17.4)** | **1,144,942.5** | **1,204,301.4** | **(4.9)** |
| පාරිභෝගික භාණ්ඩ | 1,220.4 | 1,780.0 | (31.4) | 217,824.3 | 276,139.7 | (21.1) |
| අන්තර් භාණ්ඩ | 3,656.8 | 4,329.8 | (15.5) | 653,061.7 | 671,537.2 | (2.8) |
| ආයෝජන භාණ්ඩ | 1,532.9 | 1,590.7 | (3.6) | 273,623.6 | 246,698.8 | 10.9 |
| වෙනත් | 2.4 | 64.1 | (96.2) | 432.8 | 9,925.6 | (95.6) |
| **වෙළඳ ශේෂය** | **(2,458.2)** | **(3,980.9)** | **-** | **(438,148.7)** | **(617,399.0)** | **-** |

(අ) තාවකාලික



















## 4.6 වෙළෙඳ දර්ශක (2010= 100 ) [අ]

| අයිතමය | 2019 අප්‍රේල් [ආ] | පෙර මාසය [ආ] | පෙර වසර |
|---|---|---|---|
| මුළු අපනයන | | | |
| වටිනාකම | 111.1 | 158.2 | 110.7 |
| ප්‍රමාණය | 110.7 | 195.8 | 101.2 |
| ඒකක වටිනාකම | 100.3 | 80.8 | 109.4 |
| මුළු ආනයන | | | |
| වටිනාකම | 142.8 | 154.7 | 160.5 |
| ප්‍රමාණය | 154.2 | 170.8 | 168.0 |
| ඒකක වටිනාකම | 92.6 | 90.6 | 95.5 |
| වෙළෙඳ මිල අනුපාතය | 108.3 | 89.2 | 114.5 |

(අ) එ.ජ. ඩොලර්වලින් අගය කරන ලද (ආ) තාවකාලික

## 4.7 වෙළෙඳ භාණ්ඩ මිල ගණන්

| අයිතමය | 2019 [අ] අප්‍රේල් | 2018 අප්‍රේල් | % වෙනස | 2019 [අ] අප්‍රේල් | 2018 අප්‍රේල් | % වෙනස |
|---|---|---|---|---|---|---|
| | කි.ග්‍රෑම් 1ක් එ.ජ. ඩො. | | | කි.ග්‍රෑම් 1ක් රුපියල් | | |
| කොළඹ තේ වෙන්දේසි මිල | 3.31 | 3.89 | -14.89 | 578.84 | 607.47 | -4.71 |
| ආනයන (මි.ර.ගා) | මෙට්‍රික් ටොන් 1ක් එ.ජ. ඩො. | | | මෙට්‍රික් ටොන් 1ක් රුපියල් | | |
| සහල් | 551.21 | 411.02 | 34.11 | 96,352.70 | 64,174.41 | 50.14 |
| සීනි | 357.31 | 405.95 | -11.98 | 62,458.54 | 63,383.22 | -1.46 |
| තිරිඟු | 281.86 | 261.63 | 7.73 | 49,269.85 | 40,849.55 | 20.61 |
| | බැරලයක් එ.ජ. ඩො. | | | බැරලයක් රුපියල් | | |
| බොරතෙල් | 75.59 | 74.31 | 1.72 | 13,213.24 | 11,602.36 | 13.88 |

(අ) තාවකාලික